# දියමන්ති ව්‍යාපෘතියට අදාළ ඉතිහාසය විෂය අධ්‍යයන ඉලක්ක.

## (සබරගමු පළාතේ සියලු පාසල් සඳහා)

**පළමුවන අදියර**

**8 ශ්‍රේණිය**

**පළමු වාරය - පෙරදිග සංගීතය**

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **01** | **1.0** සංගීතයේ මූලිකාංග ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන/වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි. | 1.1 ශුද්ධ සහ කෝමල ස්වර ඇතුළත් රාග හඳුනා ගනිමින් රාගධාරී සංගීතයේ ප්‍රායෝගික අධ්‍යයනයට එළඹෙයි. | • බිලාවල් රාගාශ්‍රිත ස්වර ස්ථාපන ගීත. (සිරස නමමු මව් පොළොවට)<br>• "අඬවන් වූ දෙනෙතින් ගලනා" ගීතය ගයා වයා රස විඳිමින් පාඩමට පිවිසෙන්න.<br>• මීට පෙර පන්තිවලදී ගයන ලද, අධ්‍යයනය කරන ලද ශුද්ධ ස්වර ස්ථාපන ගීත සිසුන් සමඟ ගායනය කිරීම.<br>• එම ශුද්ධ ස්වර ස්ථාපන ගීතයේ ස්වර ප්‍රස්ථාරය ද ගායනය කරවීම. | 01<br>විනාඩි 40 | ජනවාරි 01 සතිය |
| | | | • "සිරස නමමු මව් පොළොවට" යන ගීතයේ දෘශ්‍ය උපකරණය ප්‍රදර්ශනය කර එහි ස්ථායි අන්තරා පද සුවිශේෂී ඉගැන්වීමේ ක්‍රම භාවිතා කරමින් ගායනයට හුරු කරවීම.<br>• විවිධ ක්‍රම භාවිතා කරමින් ගායනයට හුරු කරවීම.<br>• කේවලව හා සාමූහිකව ගීතය ස්වර ප්‍රස්ථාරය පෙළින් පෙළ ගායනය කරවීම. | 02<br>විනාඩි 40 | ජනවාරි 01 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| | | | • බිලාවල් රාගයේ යෙදෙන ශුද්ධ ස්වර හතම හොඳින් අවබෝධ වී ඇත්දැයි විමසීමට විවිධ ඉගැන්වීමේ ක්‍රියාකාරකම් වල යෙදීම.<br>• අධ්‍යයනය කළ ගීතයෙන් තෝරාගත් විශේෂ ස්වර සංගති කොටස් වෙන් වෙන් වශයෙන් ගෙන එම ස්වර සංගති ගායනයට හුරු කරවීම.<br>• අධ්‍යයනය කළ ගීතය කණ්ඩායම් වශයෙන් හා කේවල වශයෙන් ගෙන සදොස් තැන් නිදොස් කරමින් ගායනයට සලස්වන්න. | 03<br>විනාඩි 40 | ජනවාරි 02 සතිය |
| | | | • තහවුරු කිරීමේ ක්‍රියාකාරකම්. | 01<br>විනාඩි 40 | ජනවාරි 02 සතිය |
| **0.1** | | 1.2 මිශ්‍ර මත් කැටි ඇති තාල පද අධ්‍යයනය කරයි. | • හින්දුස්ථානි තාලයක කොටස් හඳුන්වා දීම.<br>* මාත්‍රා<br>* විභාග<br>* තාලස්ථාන (×, 2, 0, 3)<br>* ආවර්ථ<br>* ඨේකා යන පාරිභාෂික පද පැහැදිලි කර හඳුන්වා දීම | 01<br>විනාඩි 40 | ජනවාරි 03 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| | | | • මීට පෙර පන්ති වලදී අධ්‍යයනය කර ඇති තාල පදයක් තෝරා එය සිසුන්ට ප්‍රදර්ශනය කර වාදනය කර පෙන්වන්න.<br>• පසුව තාල පද සිසුනට ප්‍රදර්ශනය වන පරිදි අතින් තාල තබා පෙන්වන්න.<br>• ඒකලව හා සාමූහිකව සිසුන් කණ්ඩායම් කර හෝ පෙර ඉගෙනගත් තාල් පදය අතින් තාල තබා පෙන්වීමට යොමු කරවීම.<br>• එසේ කරන සිසුන් අගයන්න. | | |
| **0.1** | | 1.2 මිශ්‍ර මත් කැටි ඇති තාලපද අධ්‍යයනය කරයි. | • හින්දුස්ථානි තාල පදයක (ත්‍රිතාලය) කොටස් නම් කර ඇති දෘශ්‍ය උපකරණය ප්‍රදර්ශනය කරන්න.<br>• එය කියවීම සඳහා සිසුන්ට ප්‍රදර්ශනය කර එහි දක්වා ඇති තාල්පද කොටස් පිළිබඳ විස්තර කිරීම සඳහා සිසුන් කණ්ඩායම් වශයෙන් හෝ ඒකලව සූදානම් කරන්න.<br>• මාත්‍රා, විභාග, ඨේකා, සමග්‍රහ, ඛලිය, අනුතාල, ආවර්ථ යන තාල පද කොටස් පිළිබඳ සාකච්ඡා කර ඉන් පසු ඒ ඒ කොටස් පිළිබඳ විස්තර සටහන් කර ගැනීම සඳහා සිසුන් යොමු කිරීම. | 01<br>විනාඩි 40 | ජනවාරි 03 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **0.1** | | 1.2 මිශ්‍ර මත් කැටි ඇති තාලපද අධ්‍යයනය කරයි. | • හින්දුස්ථානි තාල පද<br>• ඣප්තාලය සහ දීප්චන්දි තාලය<br>• මීට පෙර ඉගෙන ගත් දාදරා, කෙහෙර්වා ත්‍රිතාලය වැනි තාල් පද වල අදාළ ගීතයක් රසවත්ව ගායනා කිරීම. සිසුන් සමඟ ද අත්තල යොදමින් ගායනා කරවීම.<br>• එම තාලවල ඇති මාත්‍රා සංඛ්‍යාවන් වෙන වෙනම සාකච්ඡා කිරීම.<br>• පසුව ඣප්තාලය හා දීප්චන්දි තාල දෙකෙහි යෙදෙන මාත්‍රා පිළිබඳ දෘශ්‍ය උපකරණය මගින් පැහැදිලි කර පෙන්වා දීම.<br>• එහි මාත්‍රා මිශ්‍රව පිහිටන බව පැහැදිලි කරදීම.<br>• ජඡ් තාලය මාත්‍රා 2, 3 වශයෙන් ද දීප්චන්දි තාලය මාත්‍රා 3, 4 වශයෙන්ද විභාග වන බව පැහැදිලි කිරීම.<br>• තාල් පද දෙක ප්‍රස්ථාර කර පොතේ සටහන් කරගන්නා ලෙස යොමු කිරීම.<br>• තහවුරු කිරීමේ ක්‍රියාකාරකම්<br>• මාසික පරීක්ෂණය<br>• ක්‍රීඩා ප්‍රසංගය සඳහා පුහුණු කිරීම. | 02<br>විනාඩි 80<br><br>01<br><br>01<br>විනාඩි 80<br>02<br>විනාඩි 80 | ජනවාරි 03 සතිය<br><br>ජනවාරි 04 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **0.1** | **2.0** වාද්‍ය භාණ්ඩයේ ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි. | 2.1 වාදනයේ මූලික හැකියා වර්ධනය කර ගනියි. | • ස්වර පුවරුවෙන් ශුද්ධ ස්වර සහිත ගීත වාදනය.<br>• සිසුනට ගැලපෙන ගීත දෙකක් තෝරා ගෙන සිසුන්ගේ දක්ෂතාවය අනුව වාදනය කරවන්න.<br>• පෙර පන්ති වලදී වැයූ ස්වර රටා නැවත වාදනය කරමින් පාඩමට පිවිසීම.<br>• ශුද්ධ ස්වර සහිත ගීත වල ස්වර ප්‍රස්ථාර ඇතුලත් පත්‍රිකා සිසුන් අතට පත් කිරීම.<br>• එක් එක් සිසුවාගේ ස්වර පුවරු භාණ්ඩ මඟින් එම ශුද්ධ ස්වර ඇතුළත් ගීත වාදනයට උපදෙස් දීම.<br>• කණ්ඩායම් වශයෙන් හෝ තනිතනිව වාදනය කිරීමට සැලැස්වීම.<br>• අතිරේක උදව් වශයෙන් පහත ගීත ලැයිස්තුව උපයෝගී කොට ගත හැක.<br>**1.** ලංකා ලංකා<br>**2.** නිල් අහස් තලේ<br>**3.** ලලිත කලා | 02<br>විනාඩි 80 | ජනවාරි 04 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **0.2** | | 2.1 | • තහවුරු කිරීමේ ක්‍රියාකාරකම්.<br>• පෙර දිනයකදී සිසුනට තමන් සතු සංගීත භාණ්ඩ ගෙන ඒම සඳහා උපදෙස් දීම.<br>• නියමිත දිනට පන්ති කාමරයේ සිසුන් භාණ්ඩ අනුව වර්ග කර කණ්ඩායම් කිරීම.<br>• පළමුව ශුද්ධ ස්වර සහිත ස්වර අභ්‍යාස වාදනය කිරීමට සැලැස්වීම.<br>• නියමිත දිනට අදාල කෝමල ස්වර සහිත ගීත කිහිපයක් දෘශ්‍ය උපකරණ මගින් ප්‍රදර්ශනය කිරීම.<br>• ශුද්ධ ස්වර අභ්‍යාස මෙන්ම කෝමල ස්වර අභ්‍යාස එනම්, කෝමල ග නි සහිත අභ්‍යාස සම සමව අභ්‍යාස කරවිම. | 01<br>විනාඩි 80 | ජනවාරි 05 සතිය |
| | | 2.1 | • භාණ්ඩ අනුව හෝ තනි තනිව හෝ වාදනය කිරීමට සැලැස්වීම.<br>• සදොස් තැන් ඇතොත් නිදොස් කොට නැවත නැවත වාදනය කරවීම. | 01<br>විනාඩි 40 | පෙබරවාරි 01 සතිය |
| | | 2.1 | • ශුද්ධ ස්වර සහිත ගීත වාදනය.<br>• සිසුනට තම භාණ්ඩයට අයත් ශිල්ප ක්‍රම සුළු වශයෙන් හෝ භාවිතා කරමින් වාදනය කරවීම. | 02<br>විනාඩි 80 | පෙබරවාරි 02 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
| --- | --- | --- | --- | --- | --- |
| | | | • මධ්‍ය සප්තකයෙන් ආරම්භ කර තාර සප්තකය දක්වා අනුගමනය කරමින් විවිධ සරල ශිල්ප ක්‍රම භාවිතා කරමින් වාදනය හුරු කරවීම.<br>• භාණ්ඩ නිවැරදි ඉරියව්වෙන් වැයීම, ස්වර ස්ථානයන්ගේ නිවැරදි බව හඳුනාගෙන වාදනය කිරීමට උපදෙස් දීම හා හුරු කිරීම. | 02<br>විනාඩි 80 | පෙබරවාරි 03 සතිය |
| | | 2.1 | • භාණ්ඩ අනුව හෝ තනි තනිව හෝ වාදනය කිරීමට සැලැස්වීම.<br>• සදොස් තැන් ඇතොත් නිදොස් කොට නැවත නැවත වාදනය කරවීම. | 01<br>විනාඩි 40 | පෙබරවාරි 01 සතිය |
| | | 2.1 | • ශුද්ධ ස්වර සහිත ගීත වාදනය.<br>• සිසුනට තම භාණ්ඩයට අයත් ශිල්ප ක්‍රම සුළු වශයෙන් හෝ භාවිතා කරමින් වාදනය කරවීම. | 02<br>විනාඩි 80 | පෙබරවාරි 02 සතිය |
| **03** | **2.0** වාද්‍ය භාණ්ඩයන් හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි. | 2.1 වාදනයේ මූලික හැකියා වර්ධනය කරගනී. | <u>**සිතාරයේ ස්වභාවය හා ස්වර පිහිටීම.**</u><br>• දක්ෂ සිතාර් ශිල්පියෙකුගේ නිර්මාණයක් ශ්‍රවණයට සැලසීම.<br>• ඇමුණුම 1 භාවිතයෙන් සිතාරයේ කොටස් හඳුන්වා දීම. | 02<br>පැය 01 වි. 20 | ජනවාරි 03 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| | | | • ඇමුණුම 2 තොරතුරු පත්‍රිකාව ඇසුරින් සිතාරය පිළිබඳව සිසුන් සමඟ සාකච්ඡා කරමින් සටහන ගොඩනැගීම.<br>• ස්වර පිහිටීම පිළිබඳ පැහැදිලි කිරීම. (ඇමුණුම 3 භාවිතයෙන්.)<br>**<u>එස්රාජයේ ස්වභාවය හා ස්වර පිහිටීම.</u>**<br>• එස්රාජ් වාදනයක් ඇසීමට සැලැස්වීම.<br>• ඇමුණුම 1 අනුව එස්රාජය හඳුනාගැනීමට සැලැස්වීම.<br>• ඇමුණුම 2 භාවිතයේ එස්රාජය පිළිබඳ තොරතුරු පැහැදිලි කිරීම හා සටහන ගොඩනැගීම.<br>• ඇමුණුම 3 ප්‍රදර්ශනය කර එස්රාජයේ ස්වර පිහිටීම පිළිබඳව අධ්‍යයනයට යොමු කිරීම.<br>• එස්රාජයේ පර්දා පිහිටීම පිළිබඳව පැහැදිලි කිරීම.<br>• එස්රාජයේ ස්වර පිහිටීම තනිවම ලකුණු කිරීමට යොමු කිරීම. | 02<br>පැය 01 වි. 20 | පෙබරවාරි 04 සතිය |
| | | | • මාසික පරීක්ෂණය | 01<br>විනාඩි 40 | පෙබරවාරි 04 සතිය |
| | | | • සමස්ථ ලංකා සංගීත තරඟ පුහුණුව. | 02<br>විනාඩි 80 | |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| | **1.0** දේශීය ජන සංගීතාංග පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කරගනිමින් සංස්කෘතික උරුමයන් රැකගැනීම. | 1.1 කෙත හා බැඳි ගැමි ගී පිළිබඳ විමසමින් ගායනය කරයි. | • "සිරිසරු සාරකෙතේ" යන ගීතය ගායනා කිරීම.<br>• ගොයම් ගී පිළිබඳ විස්තර කිරීම.<br>• නිර්දේශිත ගොයම් ගී අතුරින් එක් ගොයම් ගීයක් ගායනය කිරීම.<br>• තහවුරු කිරීමේ ක්‍රියාකාරකම්. | 01<br>විනාඩි 40<br><br>01<br>විනාඩි 40 | මාර්තු 01 සතිය<br><br>මාර්තු 02 සතිය |
| | **1.0** රංග සම්ප්‍රදායන්හි විශේෂතා අධ්‍යයනය කරමින් සංගීතමය ලක්ෂණ පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබයි. | 1.1 ශ්‍රී ලංකාවේ පැවති ප්‍රබල රංග සම්ප්‍රදායයන් හඳුනා ගනිමින් අගය කරයි. | • බෝදොස් කියා හා ලෝනා මුණිරාජාගේ යන නිර්ශිත ගීත දෙකෙන් එකක් ගායනා කිරීම.<br>• නාද මාලාව තහවුරු වන තෙක් ගායනය කිරීම.<br>• නිර්දේශිත නාට්‍ය ගීත දෙකෙන් එකක් නාදමාලාව තහවුරු වන තෙක් ගායනය කිරීම.<br>• තහවුරු කිරීමේ ක්‍රියාකාරකම්<br>• පළමු වාර පරීක්ෂණය. | 01<br>විනාඩි 40<br><br>01<br>විනාඩි 40<br><br>01<br>විනාඩි 40<br><br>06<br>විනාඩි 40 | මාර්තු 03 සතිය<br><br>මාර්තු 04 සතිය<br><br>මාර්තු 04 සතිය<br><br>අප්‍රේල් 01, 02 සතිය |

## දෙවන වාරය - පෙරදිග සංගීතය

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **1.0** | **1.0** සංගීතයේ මූලිකාංග ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන/ වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි. | 1.1. ශුද්ධ සහ කෝමල ස්වර ඇතුළත් රාග හඳුනා ගනිමින් රාගධාරී සංගීතයේ ප්‍රායෝගික අධ්‍යයනයට එළඹේ. | • භූපාලි රාගාශ්‍රිත ස්වර ස්ථාපන ගීත.<br>• බිලාවල් රාගාශ්‍රිත ස්වර ස්ථාපන ගීතය නැවත ගායනා කර පෙන්වීම.<br>• භූපාලි ස්වර ස්ථාපන ගීතය ඇතුළත් දෘශ්‍යාධාරය සිසුන්ට ප්‍රදර්ශනය කිරීම.<br>• එහි දක්වා ඇති ගීතය පෙළින් පෙළ ගයා වයා පෙන්වා සිසුන් සමඟ ද ගායනය කරවීම.<br>• ස්ථායි අන්තරා ස්වර ද පෙළින් පෙළ ගායනය කරවීම.<br>• භූපාලි රාගයේ ස්වර ස්ථාපනය වී ඇත්දැයි විමසීමට විවිධ ක්‍රියාකාරකම්වල යෙදවීම.<br><br>• පුහුණු කළ ගීතයේ තෝරාගත් කොටස් ගායනය කරවීම, වාදනය කරවීම.<br>• නිදහස් කාලවලදී භූපාලි රාගාශ්‍රිත සරල ගීත ගායනයට යොමු කරවීම. | 02<br>විනාඩි 80<br><br>01<br>විනාඩි 40 | අප්‍රේල් 03 සතිය<br><br>අප්‍රේල් 04 සතිය |
| **1.0** | | 1.2. මිශ්‍ර මත් කැටි ඇති තාල පද අධ්‍යයනය කරයි. | • ඣප්තාල් දීප්චන්දි තාල හා බැඳි නිර්මාණාත්මක ක්‍රියා.<br>• මිශ්‍ර මත් කැටි සහිත තාල පද අනුව විවිධ රිද්ම රටා ප්‍රස්ථාර කර දක්වූ දෘශ්‍ය උපකරණය පෙන්වීම. | 02<br>විනාඩි 80 | අප්‍රේල් 04 සතිය<br>මැයි 01 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| | | | • ඝඩප්තාලයට හෝ දීප්චන්දි තාලයට හෝ නිර්මාණය වූ සිසුන් දන්නා ගීතයක් (රන්වන් කරල් සැලෙයි / සිරි සාර අති ශාන්ත) රසවත්ව ගායනා කරවීම.<br>• විවිධ රිද්ම රටා මතුවන අයුරින් එම ගීතයට අත අතැගිලි යොදා ගනිමින් විවිධ තාල රටා නිරූපණය කරවීම.<br>• ඉහත ගීත දෙකට ගැලපෙන තාල රටාවන් රිද්ම රටාවන් සිසුන් ලවා වාදනය කරවීම.<br>• නිර්මාණය කරගත් රිද්ම රටා අලංකාරව සාමූහිකව හා තනි තනිවම වාදනය කරවීම. | 02<br>විනාඩි 80 | |
| **2.0** | වාද්‍ය භාණ්ඩයේ ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි. | වාදනයේ මූලික හැකියා වර්ධනය කර ගනියි. | **<u>ස්වර පුවරුව මඟින් කෝමල ග නි සහිත ස්වර ස්ථාපන ගීත වාදනය</u>**<br>• 6 ශ්‍රේණියේදී වැයූ කෝමල ස්වර සහිත ගීත නැවත වාදනය කර ශ්‍රවණයට සැලසීම.<br>• දක්ෂ ශිල්පීන්ගේ වාදනයක් ශ්‍රවණයට සලස්වා එහි වටිනාකම පැහැදිලි කිරීම.<br>• දක්ෂ ලෙස වාදනය කිරීමට සතත අභ්‍යාසයේ ඇති වටිනාකම පහදා දීම.<br>• කෝමල ග නි සහිත ස්වර ස්ථාපන ගීතයන්හි ස්වර ප්‍රස්ථාර ඇතුලත් පත්‍රිකා සිසුන්ට ලබාදී වාදනයට යොමු කිරීම.<br>• අවශ්‍ය උපදෙස් ලබා දෙමින් නිවැරදිව වාදනයට මඟ පෙන්වීම. | 02<br>විනාඩි 80 | මැයි 01 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **2.0** | වාද්‍ය භාණ්ඩයේ ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි. | 2.1. වාදනයේ මූලික හැකියා වර්ධනය කරගනියි. | **ස්වර වාද්‍ය භාණ්ඩ මගින් කෝමල ග නි සහිත ගීත වාදනය**<br>• කිසියම් භාණ්ඩයකින් ශුද්ධ ගනි සහ කෝමල ගනි ස්වර වෙන් වෙන්ව වාදනය කර ශ්‍රවණයට සැලසීම.<br>• ස්වර වෙන්කර හඳුනාගැනීම.<br>පුහුණු වීමේ වටිනාකම පැහැදිලි කිරීම.<br>• කෝමල ගනි සහිත ගීතයන්හි ස්වර ප්‍රස්ථාර ඇතුළත් පත්‍රිකා සිසුන්ට ලබාදී වාදනයට යොමු කිරීම.<br>• කෝමල ගනි ස්වර නිවැරදිව වාදනය කිරීමට මග පෙන්වීම.<br>• මාසික පරීක්ෂණය<br>• රාජ්‍ය උත්සව සඳහා ප්‍රසංග පුහුණු කිරීම් | 02<br>විනාඩි 80<br><br>01<br>විනාඩි 40 | මැයි 02 සතිය<br><br>මැයි 02 සතිය<br>මැයි 03 සතිය |
| **3.0** | සංගීත රසාස්වාදයේ යෙදෙමින් ජීවිතයේ සතුට හා බැඳි මානසික තත්ත්වයන් ළඟා කරගැනීමට හුරු වෙයි. | 3.1. සරල ගීත රසාස්වාදයේ යෙදෙයි.<br>සරල ගීතයක කොටසක් බස හා ආකෘතිය | **ස්වර වාද්‍ය භාණ්ඩ මගින් කෝමල ගනි සහිත ගීත වාදනය**<br>• දුනුකෙයියා මලක් වගේ සහ ජගන් මෝහිනී යන ගීත ඇතුලත් දෘශ්‍ය උපකරණ ප්‍රදර්ශනය කිරීම.<br>• ගීතයක පදමාලාව හා තනුව පිළිබඳව පහදා දීම. | 01<br>විනාඩි 40 | මැයි 04 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| | | | • එහි භාෂාව පිළිබඳව සිසුන් සමඟ සාකච්ඡා කිරීම.<br>• වෙනත් ගීතයක ප්‍රස්ථාරයක් ප්‍රදර්ශනය කර ගයා වයා පෙන්වීම.<br>• සිසුන්ද සහභාගි කරගනිමින් ගායනය වාදනය කිරීම.<br>• එහි ඇති බෙරවාදන, ස්ථායි, අතුරු වාදන, අන්තරා, බිට්ස්, කවුන්ටර්ස්, ඉංග්‍රීසි වචන ආදිය පිළිබඳ විස්තර කිරීම. | | |
| **3.0** | | 3.1. භාරතීය ගීත ශෛලීන් රසාස්වාදයට හුරුවෙයි. | <u>**භජන් ගී ගායනය**</u><br>• භජන් ගීතය ලියන ලද දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කර ගයා වයා ශ්‍රවණයට සැලසීම.<br>• සිසුන් සමඟ ගායනය කිරීම.<br>• කොටසින් කොටස ගායනයට හුරු කිරීම.<br>• තාල වාද්‍ය භාණ්ඩයක් සමඟ ගායනයට හුරු කිරීම. | 01<br>විනාඩි 40 | ජුනි 01 සතිය |
| **1.0** | දේශීය ජන සංගීතාංග පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කරගනිමින් සංස්කෘතික උරුමයන් රැක ගනියි. | 1.1. කෙත හා බැඳි ගැමි ගී පිළිබඳ විමසමින් ගායනය කරයි. | <u>**නෙළුම් ගී ගායනය කරමු.**</u><br>• සුනිල් ශාන්ත මහතාගේ “තෙල් ගාලා හිස පීරන් නැනෝ” ගීතය ලියූ දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කිරීම. | 02<br>විනාඩි 80 | ජුනි 01 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| | | | • ගුරුවරයා විසින් ගීතය ගයා වයා ශ්‍රවණයට සැලසීම.<br>• ගීතය පිළිබඳ සාකච්ඡා කිරීම.<br>• නෙළුම් ගීතය ලියූ දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කිරීම.<br>• ගායනය වාදනය කර ශ්‍රවණයට සැලැස්වීම.<br>• නාදමාලාව තහවුරු වන තෙක් පදයෙන් පදය ගායනය කරවීම.<br>• තාල තබමින් ගායනයට යොමු කිරීම.<br>• නෙළුම් ගීත පිළිබඳ සාකච්ඡා කිරීම.<br>• ඒ අයුරින්ම දෙවන ගීතයද ගායනයට යොමු කිරීම.<br>• තහවුරු කිරීමේ ක්‍රියා. | | ජුනි 02 සතිය |
| | | | **<u>කමත් ගී ගායනය.</u>**<br>• "ඔයිරයිරේ ඔයිරාමා" අඬහැරය ලියූ දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කිරීම.<br>• ගයා වයා ශ්‍රවණයට සැලසීම.<br>• ගීතය පිළිබඳ සාකච්ඡා කිරීම.<br>• කමත් ගීතය ලියූ දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කිරීම. | 01<br>විනාඩි 40 | ජුනි 03 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| | | | • ගුරුවරයා විසින් ගයා වයා ශ්‍රවණයට සැලසීම.<br>• සිසුන් ගායනයට යොමු කිරීම.<br>• කමත් ගී පිළිබඳව සිසුන් සමග සාකච්ඡා කිරීම.<br>• නිවැරදි නාදමාලාව ගායනයට හුරුකිරීම.<br>• මාසික පරීක්ෂණය. | | |
| | | | <u>ගැමි ගීයේ විශේෂ ලක්ෂණ.</u><br>• සකස් කරගත් දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කිරීම.<br>• ගැමි ගීයක් හා සේ ගීයක් ගයා වයා ශ්‍රවණයට යොමු කිරීම.<br>• සිසු අදහස් විමසමින් සාකච්ඡා කිරීම.<br>• සිසු අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම.<br>• එම කරුණු සටහන් කරගැනීමට යොමු කිරීම.<br>• සටහන් කරගත් කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදී සදොස් තැන් නිදොස් කිරීම. | 02<br>විනාඩි 80 | ජුනි 04 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **5.0** | සරල සංගීතය හා බැඳි සංගීතාංග පිළිබඳව අත්දැකීම් ලබයි. | 5.1 දමිල බසින් රචිත ගීතයක් ගායනය කරයි. | <u>දමිල ගී ගායනය.</u><br>• ද්‍රවිඩ ගීතයක් ලියනලද දෘෂ්‍යාධාරකය ප්‍රදර්ශනය කිරීම.<br>• ගුරුවරයා විසින් ගයා වයා ශ්‍රවණයට සැලසීම.<br>• කොටසින් කොටස ගායනයට පුහුණු කරවීම.<br>• තාලානුකූලව සාමූහිකව ගායනයට යොමු කිරීම.<br>• දෙවන ගීතය (චින්නචින) ප්‍රදර්ශනය කරන්න.<br>• ගුරුවරයා විසින් ගයා වයා ශ්‍රවණයට යොමු කිරීම.<br>• සිසුන් සමඟ ගායනය කිරීම.<br>• සිංහල අරුත සාකච්ඡා කරමින් රස වින්දනයක යෙදවීම. | 02<br>විනාඩි 80 | ජුලි 01 සතිය |
| **5.0** | | 5.2.1 පිය ගුණ ගීයක් ගායනය කරයි. | <u>පියගුණ වර්ණ ගීයක් ගායනය.</u><br>• පියගුණ ගීතය ඇතුළත් ශ්‍රව්‍ය පටය ශ්‍රවණයට සැලසීම.<br>• ගීතය ගායනයට යොමු කිරීම.<br>• පද මාලාව, නාද මාලාව, සංගීත නිර්මාණය, ගායකයාගේ හඬ, සුසංයෝගී වී ඇති ආකාරය සාකච්ඡා කිරීම.<br>• වාද්‍ය භාණ්ඩ යොදාගනිමින් ගායනයට යොමු කිරීම.<br>• තනි තනිව හෝ කණ්ඩායම් කර ගායනය කරවා අගය කිරීම. | 01<br>විනාඩි 80 | ජුලි 01 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **6.0** | රංග සම්ප්‍රදායන්හි විශේෂතා අධ්‍යයනය කරමින් සංගීතමය ලක්ෂණ පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබයි. | 6.1 ශ්‍රී ලංකාවේ පැවති ප්‍රබල රංග සම්ප්‍රදායන් හඳුනා ගනිමින් අගය කරයි. | <u>නූර්ති ගීත ගායනය.</u><br>• නූර්ති ගීතය ලියූ දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කිරීම.<br>• ශ්‍රව්‍ය පටයේ ඇති ඇති එම ගීතය ශ්‍රවණයට සැලසීම.<br>• ගීතය පියවරෙන් පියවර ගායනයට හුරු කිරීම.<br>• නාදමාලාව තහවුරු වන තෙක් ගායනයට යොමු කිරීම.<br>• කේවලව ගායනයට යොමුකර ඇගයීම. | 01<br>විනාඩි 40 | ජුලි 02 සතිය |
| **6.0** | | | <u>නාඩගම් ගීත ගායනය.</u><br>• තෝරාගත් ගීතය ඇතුලත් දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කිරීම හා ශ්‍රවණයට සැලසීම.<br>• ගීතයේ රංගන අවස්ථාව පිළිබඳව සිසුන් සමඟ සාකච්ඡා කිරීම.<br>• තෝරා ගත් ගීතය ගුරුවරයා විසින් ගයා වයා සිසුන් ලවා ගායනය කරවීම.<br><u>නාඩගම් හා නූර්ති රංග සම්ප්‍රදායන්හි ශෛලිය සංගීතය හා විශේෂතා හඳුනා ගැනීම.</u><br>• නාඩගම් ගීයක් හා නූර්ති ගීයක් ගයමින් වයමින් ශ්‍රවණයට යොමු කිරීම. | 02<br>විනාඩි 80 | ජුලි 02 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| | | | • කියවීම් පත්‍රිකා සහ ගවේෂණ උපදෙස් පත්‍රිකා සිසුන් වෙත ලබා දීම.<br>• රූප සටහන් භාවිතා කරමින් නූර්ති නාඩගම් රංග ශෛලීන් පිළිබඳ විස්තර කිරීම.<br>• අදාළ ක්‍රියාකාරකම්හි සිසුන් නිරත කිරීම.<br>• අවසන් කළ ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම. | 01<br>විනාඩි 40 | ජුලි 03 සතිය |
| **8.0** | **8.0** සංකේතානුසාරයෙන් සංගීතය ලියා දක්වන විධි හඳුනා ගනිමින් විශ්ව සංගීත කෘති ඇසුරු කිරීමටත් දේශීය සංගීතාංග ලෝකය වෙත යොමු කිරීමටත් අත්‍යාවශ්‍ය මූලික නිපුණතා වර්ධනය කර ගනියි. | **8.1** ශ්‍රවණ මාධ්‍යයෙන් ගී පද ප්‍රස්ථාර කරයි. | • සදැස්මත් සහ ගී මත් හඳුනාගැනීම.<br>• “කොබෝ කුරුළු වනේ” දෘශ්‍යාධාරය ලියූ පත්‍රිකාව ප්‍රදර්ශනය කරන්න.<br>• ඇදීම් සහිතව ගායනා කර පෙන්වීම.<br>• පැදියේ වචනවලට හිමි මාත්‍රා ගණනය කරවන්න.<br>• සදැස්මත් යනු, එසේ ගණනය කිරීම බව පහදා දීම.<br>• ගීමත් යනු, එම පැදියට විභාගවලට බෙදා ප්‍රස්තාර කර ගණනය කිරීම.<br>• බොහෝ විට සදැස්මත් වලට වඩා ගීමත් ගණන වැඩිවන බව සිසුන්ට ප්‍රස්තාරකරණයෙන් හා ගායනයෙන් පහදා දීම.<br>• අවශ්‍ය සටහන් ලියා ගැනීමට සැලැස්වීම. | 01<br>විනාඩි 40 | ජුලි 03 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **8.0** | | **8.1** | **යතිය සහ යති සහිත ගී පද ප්‍රස්තාරකරණය**<br>• දෘශ්‍ය උපකරණය ප්‍රදර්ශනය කර එහි තිබෙන යතිය සහිත පැදිය ගායනා කර පෙන්වීම.<br>• යති පිහිටන ස්ථානය හොඳින් නිරීක්ෂණය කිරීමට සිසුන්ට පහදා දීම.<br>• යති පිහිටන ආකාරයට අනුව මාත්‍රා ගණනය කිරීමට අවස්ථාව සැලසීම.<br>• පැදියක යති අග සහ මැද පිහිටන බව පහදා දීම.<br>• අවශ්‍ය සටහන් සටහන් කරගැනීමට උපදෙස් දීම. | 01<br>විනාඩි 40 | ජුලි 03 සතිය |
| **8.0** | | **8.1** බටහිර සංගීත ප්‍රස්ථාරකරණයේ මූලිකාංග විමසයි. | **රේඛා මණ්ඩලය මත ස්වර පිහිටන අයුරු**<br>• රේඛා මණ්ඩලය මත ස්වර ප්‍රස්ථාර කළ දෘශ්‍ය උපකරණ ප්‍රදර්ශනය කර එය ගයා වයා ශ්‍රවණයට සලස්වන්න.<br>• එය පෙරදිග ස්වර මගින් ගයාවයා පෙන්වමින් ප්‍රස්ථාර ගත කර පෙන්වන්න.<br>• ස්වර ඛණ්ඩයක් රේඛා මණ්ඩලයේ සටහන් කරයි. | 01<br>විනාඩි 40 | ජුලි 03 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| | | **8.2** | • දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කිරීම.<br>• ප්‍රස්ථාර කොටස් අතර සම්බන්ධය පහදයි.<br>• වර්ිනාකම් පිළිබඳ දෘශ්‍යාධාර ප්‍රදර්ශනය කරයි.<br>• එකිනෙක සාකච්ඡා කරයි.<br>• Dotted Notes සංකේතය හඳුන්වයි.<br>• කාර්ය පත්‍රිකා 2 වගුව සම්පූර්ණ කරයි.<br>• බටහිර ක්‍රමයට පෙරලා ප්‍රස්ථාර කරයි.<br>• ස්වර ස්ථාපන ගී ප්‍රස්ථාර කිරීමට උපදෙස් දීම.<br><br>* වාර පරීක්ෂණ සඳහා | 02<br>විනාඩි 80 | ජුලි 04, 05 සතිය |

## තුන්වන වාරය - පෙරදිග සංගීතය

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **1.0** | සංගීතයේ මූලිකාංග ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි. | 1.1. ශුද්ධ සහ කෝමල ස්වර ඇතුළත් රාග හඳුනා ගනිමින් රාගධාරී සංගීතයේ ප්‍රායෝගික අධ්‍යයනයට පෙළඹේ. | • “සිරි සාර අති ශාන්ත ගීතය”<br>• කාෆි රාගාශ්‍රිත ස්වර ස්ථාපන ගීත.<br>• භූපාලි රාගයේ ස්වර ස්ථාපන ගීතය ගායනය කර පෙන්වීම. සිසුන් සමග ද ගායනා කිරීම.<br>• කාෆි රාගයේ ස්වර ස්ථාපන ගීතය ඇතුළත් දෘශ්‍යාධාරය පෙන්වීම.<br>• භූපාලි කාෆි රාග අතර වෙනස සාකච්ඡා කිරීම.<br>• මීට පෙර ගයා ඇති පොතපත කියවා ගීතයද සිසුන් සමග ගායනා කිරීම.<br>• කාෆි ස්වර ස්ථාපන ගීතය පෙළින් පෙළ ගායනය වාදනය කර පෙන්වීම, ගායනා කිරීම.<br>• එහි ස්ථායි අන්තරා පද සුවිශේෂ ඉගැන්වීමේ ක්‍රම භාවිතා කරමින් ගායනා කරවීම. | 02<br>විනාඩි 80 | සැප්තැම්බර් 01 සතිය |
| | | | • සම්පූර්ණ ගීතයම සදොස් තැන් නිදොස් කර කණ්ඩායම් හා තනි තනිවම ගායනය, වාදනය කරවීම. | 01<br>විනාඩි 40 | සැප්තැම්බර් 01 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **1.0** | | 1.2. මිශ්‍ර මත් කැටි ඇති තාල පද අධ්‍යයනය කරයි. | • දෙතිතට අයත් තිත් තාල පදනම් කරයි.<br>• සුළු මැදුම් දෙතිත.<br>• මැදුම් මහා දෙතිත<br>• සුළු මහා දෙතිත<br>• මාත්‍රා 2, 3, 4 බැගින් විභාග වන ජන ගීයක් ගයා වයා ශ්‍රවණය කිරීමට සැලැස්වීම.<br>• සිසුන් සමඟ ගයන අතර ඊට අත්තල යොදා ගායනා කිරීමට යොමු කිරීම.<br>• මේ ගීත අතර වෙනස වටහා දෙමින් තනිතිත, දෙතිත පිළිබඳ කෙටියෙන් විමසා සාකච්ඡා කිරීම.<br>• තනි වර්ගයක මත් කැටි වී තාල සැදෙන බවත් 2-3/ 3-4/ 2-4 ආදි වශයෙන් මිශ්‍ර වී තිත් රූප සහ තාල සැදෙන බවත් පහදා දීම.<br>• දෙතිතට අයත් තිත් රූප දෘශ්‍යාධාරකයේ පෙන්වා ඇති පරිදි ප්‍රස්ථාරගත කර ගැනීමට සිසුනට අවශ්‍ය උපදෙස් දීම. | 02<br>විනාඩි 80 | සැප්තැම්බර් 02 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **1.0** | | 1.2. මිශ්‍ර මත් කැටි ඇති තාල පද අධ්‍යයනය කරයි. | * Six Eight Rhythm ($6_8$)<br>• අම්බිලි මාමේ ඔබ මොකද<br>• කොටු වැටිච්චි පුංචි සරම<br>• යුද්දෙටත් ඇවිත්<br>• අහසට පිඹිනා<br>• දන්න වංහුං අප<br>• අතුරු මිතුරු දඹ දිවතුරු<br>• අයිරින් ජොසපින්<br>• ඉහත ගීත ලැයිස්තුවේ එන ගීත කිහිපයක් ගයා වයා ඉදිරිපත් කරන්න. හැකිනම් නොනවත්වා එකිනෙක සම්බන්ධ කරමින් (Non Stop) සිසුන් සමඟ ගයන්න. සිසුන්ව ඒ සමඟ අත්තැලීමට යොමු කරවීම.<br>• මේ සෑම ගීතයකම රිද්මය එකම ලක්ෂණයක් බවත් පහදා දෙමින් ජන ගී, සරල ගී, ළමා ගී ආදී වශයෙන් ගීත වර්ග බොහොමයක් මේ හා සම්බන්ධ වන බවත් පහදා දීම.<br>• එවැනි ගීත ලැයිස්තුවක් සකස් කිරීමට උපදෙස් දීම. | 01<br>විනාඩි 40 | සැප්තැම්බර් 02 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **2.0** | වාද්‍ය භාණ්ඩයේ ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි. | 2.1. වාදනයේ මූලික හැකියා වර්ධනය කරගනියි. | • වාද්‍ය භාණ්ඩ මගින් විවිධ ස්වර ඇතුළත් ගීත වාදනය.<br>• විවිධ ස්වර සහිත සංගීත ඛණ්ඩයක් සර්පිනාවෙන් වාදනය කර පෙන්වීම.<br>• එම ස්වර යොදා ඇති ආකාරය පිළිබඳ සිසුන්ගෙන් විමසීමක් කිරීම.<br>• විවිධ ස්වර ඇතුළත් ගීත කිහිපයක ස්වර ප්‍රස්ථාර සහිත පත්‍රිකා සිසුනට ප්‍රදර්ශනය කර වාදනය කරවීම.<br>• භාණ්ඩ අනුව කණ්ඩායම් කර තනි තනිවම හෝ කණ්ඩායම් වශයෙන් වාදනය කරවීම.<br>• ගීතයේ කොටස් අනුව වෙන්කර දී භාණ්ඩ අනුවද වෙන්කර දී සමූහ වාදනයක ස්වභාවයෙන් වාදනය කරවීම.<br>• නිවැරදිව වාදනය කරන සිසුන් ඇගයීම. | 01<br>විනාඩි 80<br><br>01<br>විනාඩි 40 | සැප්තැම්බර් 02 සතිය<br>සැප්තැම්බර් 03 සතිය<br><br>සැප්තැම්බර් 03 සතිය |
| **2.0** | | 2.1 | • "ස්වර පුවරුව මගින් ළමා ගීත වාදනය"<br>• ළමා ගීතයක් ශ්‍රවණයට සලස්වා පාඩමට පිවිසීම.<br>• වර්තමානයේ ඇසෙන ගීත හා ළමා ගීත සසඳමින් අගය පහදා දීම. | | |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| | | | • ළමා ගීත සහිත ස්වර ප්‍රස්ථාර ලබාදී වාදනය කරවීම.<br>• මුලින්ම හඳුන්වා දෙන ගීතය ස්වර වාද්‍ය භාණ්ඩයක් මගින් වාදන කොට පෙන්වා ඒ සමගම සිසුන්ට ද පුහුණුවීම් කරවීම.<br>• සිසුනට අවශ්‍ය විටදී උපදෙස් දී සහාය දක්වීම.<br>• තහවුරු කිරීමේ පරීක්ෂණය.<br>• සිසුන් අත ඇති ඕර්ගන්වලින් විවිධ භාණ්ඩයන්ගේ හඬ යොදා වාදක මණ්ඩලයක ස්වරූපයෙන් කොටස් වෙන්කර වාදනය කිරීමට යොමු කිරීම.<br>• සදොස් තැන් නිදොස් කරමින් ඇගයීම. | 01<br>විනාඩි 40<br><br>01<br>විනාඩි 40<br>01<br>විනාඩි 40 | සැප්තැම්බර් 04 සතිය<br><br>සැප්තැම්බර් 04 සතිය |
| **2.0** | සංගීත රසාස්වාදයේ යෙදෙමින් ජීවිතයේ සතුට හා බැඳි මානසික තත්ත්වයන් ළඟා කර ගැනීමට හුරුවෙයි. | 2.1 භාරතීය ගීත ශෛලීන් රසාස්වාදයට හුරු වෙයි. | • රවීන්ද්‍ර ගීත ගායනය.<br>• රවීන්ද්‍ර ගීත ඇසුරු කොට නිර්මාණය වූ සිංහල ගීයක් ගායනා කර පෙන්වීම.<br>• තෝරා ගත් ගීතය ලියන ලද දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කිරීම.<br>• ගීතය සම්පූර්ණයෙන්ම රසවත්ව සිසුන් සමඟ ගායනා කිරීම.<br>• තාල වාදන භාණ්ඩයක් සමඟ ගීතය පෙලින් පෙළ තනි තනිව ගායනා කරවීම. | 01<br>විනාඩි 40 | සැප්තැම්බර් 04 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| | | | • රවීන්ද්‍ර ගීත හා භජන් ගී ශෛලීන් හි විශේෂතා.<br>• භජන් ගීතයක හා රවීන්ද්‍ර ගීතයක කොටසක් ශ්‍රවණය කිරීමට සැලැස්වීම.<br>• එහි ලක්‍ෂණ සාකච්ඡා කිරීම.<br>• ඇමුණුම් අංක 01 සඳහන් තොරතුරු පත්‍රිකාව අනුව එම පත්‍රිකාවේ හිස්තැන් සම්පූර්ණ කිරීමට යොමු කරවීම.<br>• ඇගයීමට ලක් කිරීම. | 01<br>විනාඩි 40 | ඔක්තෝම්බර් 1 සතිය |
| **3.0** | | 3.3 කිතුණු බැති ගී රසාස්වාදනයේ යෙදෙයි. | • කිතුණු බැති ගී ගායනය.<br>• “රොනට වඩින බිඟු ඔබයි” යන ගීතය ගායනා කර පෙන්වීම.<br>• බටහිර සංගීතයේ ආභාෂය ලබා ඇති මෙම ගීතවල එම ලක්‍ෂණ ඇති බව පහදා දීම.<br>• නිර්දේශ කර ඇති ගීතය ලියන ලද දෘශ්‍යාධාරකය ප්‍රදර්ශනය කිරීම.<br>• ගීතය ගයා වයා පෙන්වීම.<br>• ගීතය පෙළින් පෙළ කොටසින් කොටස ගායනයට හුරු කිරීම.<br>• තාල වාද්‍ය භාණ්ඩයක් යොදා ගනිමින් එක් එක් කණ්ඩායම් වලට වෙන වෙනම ගීත කොටස් එකතු කරමින් ගායනය කරවීම.<br>• සාමූහිකව හා තනිතනිවම ගායනා කරවීම. | 01<br>විනාඩි 40 | ඔක්තෝම්බර් 2 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **5.0** | **5.0** | 5.2.2 මව් ගුණ ගීයක් ගායනය කරයි. | • මව් ගුණ ගීයක් ගායනය.<br>• නැළවිලි ගීයක් ගයමින් පාඩමට පිවිසීම.<br>• ගීතය ශ්‍රවණය කිරීමට සලස්වා සිසුන් සමඟ ගායනයේ යෙදීම.<br>• ගීතයෙන් කියවෙන අදහස පිළිබඳ සිසුන්ගෙන් විමසා ජාතක කතා ඇසුරෙන් මව් ගුණ පිළිඹිබු වන අවස්ථා පිළිබඳ සාකච්ඡා කිරීම.<br>• යොදාගත් සංගීතයෙන් මව් සෙනෙහස කොතෙක් දුරට උද්දීපනය වී ඇත්දැයි ගීතය ගයා වයා පෙන්වීම.<br>• තෝරාගත් ගීතයේ නාද මාලාව තහවුරු වන තෙක් සිසුන් සමඟ ගායනය කිරීම.<br>• ඒකලව හා කණ්ඩායම් වශයෙන් ඇගයීම. | 01<br>විනාඩි 40 | ඔක්තෝම්බර් 3 සතිය |
| **6.0** | **6.0** රංග සම්ප්‍රදායන්හි විශේෂතා අධ්‍යයනය කරමින් සංගීතමය ලක්ෂණ පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබයි. | 6.1 ශ්‍රී ලංකාවේ පැවති ප්‍රබල රංග සම්ප්‍රදායන් හඳුනා ගනිමින් අගය කරයි. | • නූර්ති ගීත ගායනය.<br>• නූර්ති ගීතය ලියූ දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කිරීම. ගුරුවරයා ගීතය ගායනා කර පෙන්වීම.<br>• පාදයෙන් පාදය නාද මාලාව තහවුරු වන තෙක් ගායනා කරවීම.<br>• රංගනයක් සමඟ ගීත ගායනයට හැකි සිසුන්ට අවස්ථාව සලසා දීම.<br>• කණ්ඩායම් වශයෙන් හෝ ඒකලව ගායනා කරවීම. | 01<br>විනාඩි 40 | ඔක්තෝම්බර් 4 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| | | 5.2.2 | • මද්දලය හා පද.<br>• මද්දලයක් සපයා ගත හැකිනම් එම භාණ්ඩය ප්‍රදර්ශනය කිරීම.<br>• ව්‍යවහාරික සංගීතාත්මක ගීතයක් අඩංගු CD පටයක් ශ්‍රවණයට සැලසීම.<br>• එහි තාල වාදනය සඳහා යොදා ගෙන ඇති මද්දලය වාදනය පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කිරීම.<br>• කියවීම් පත්‍රිකාවේ ඇති මද්දල් පද තාලපද උච්චාරණය කරමින් අතින් තාල තැබීමට උපදෙස් දීම. | 01<br>විනාඩි 40 | ඔක්තෝම්බර් 5 සතිය |
| | | | • නව නාට්‍ය ගී ගායනය.<br>• තෝරා ගත් ගීතය ශ්‍රවණය කිරීමට හෝ රූප රාමුවක් නැරඹීමට (පහසුකම් තිබේනම්) සැලැස්වීම.<br>• හොඳින් ශ්‍රවණය කිරීමෙන් පසු ගුරුවරයා සමග ගායනය වාදනය කිරීම.<br>• ගායනය හොඳින් ගුරුවරයා සමග සමස්ත පන්තියටම පුරුදු පුහුණු වීම.<br>• කණ්ඩායම් වශයෙන් හෝ තනි තනිවම ගායනා කිරීම. | 01<br>විනාඩි 40 | නොවැම්බර් 01 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **7.0** | **7.0** සංගීත නිර්මාණ කාර්යයයේ අත්හදා බැලීම් කරයි. | 1.1 ගීතනු නිර්මාණයේ අත්හදා බැලීම් කරයි. | • රිද්ම රටාවකට ස්වර යෙදීම.<br>• ඇමුණුම 1 වාදනය කරයි.<br>• සිසුන් සමඟ තාල තැබීමට සලස්වයි.<br>• මාත්‍රා බෙදන අයුරු දක්වයි.<br>• කැමති ස්වරයකින් පටන් ගෙන තමන් කැමති අයුරින් ස්වර සටහන් කිරීමට අවස්ථාව ලබාදීම.<br>• “ස” ස්වරයෙන් අවසන් කිරීමට උපදෙස් දීම. | 02<br>විනාඩි 80 | නොවැම්බර් 02 සතිය |
| **7.0** | **7.0** සංගීත නිර්මාණ කාර්යයයේ අත්හදා බැලීම් කරයි. | 1.1 ගීතනු නිර්මාණයේ අත්හදා බැලීම් කරයි. | • පද කොටස්වලට තනු යෙදීම.<br>• ඇමුණුම 3 ප්‍රදර්ශනය කිරීම.<br>• ගීතය ශ්‍රවණය කිරීමට සැලැස්වීම.<br>• ගී පද ප්‍රස්ථාර කර පසුව තනුව නිර්මාණය පහසු බව පහදා දීම.<br>• කණ්ඩායම් වලට බෙදා ගී පද වලට ස්වර යෙදීමට සැලැස්වීම.<br>• කණ්ඩායම් වල නිර්මාණය කළ තනු ගුරු සහාය ඇතිව ගයයි.<br>• සර්පිනා වාදනය කරමින් සෑදූ තනු මිහිරි ලෙස ගායනා කරයි.<br>• මිහිරි තනු අගයයි.<br>• 3 වාර පරීක්ෂණය. | 01<br>විනාඩි 40<br><br>02<br>විනාඩි 80 | නොවැම්බර් 03 සතිය<br><br>නොවැම්බර් 04 සතිය |
| **3.0** | | වාර්ෂික විවිධ ප්‍රසංගය | • 8 ශ්‍රේණියට නියමිත ක්‍රියාකාරකම් ඇසුරෙන් විවිධ ප්‍රසංගය සඳහා සැලසුම් කිරීම. | | නොවැම්බර් 04 සතිය<br>දෙසැම්බර් 01 සතිය |

# දියමන්ති ව්‍යාපෘතියට අදාළ ඉතිහාසය විෂය අධ්‍යයන ඉලක්ක.
## (සබරගමු පළාතේ සියලු පාසල් සඳහා)

**දෙවන අදියර**

**8 ශ්‍රේණිය**

**පළමු වාරය - පෙරදිග සංගීතය**

| අනු අංකය | ඒකකය | අනු ඒකකය | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | අතිරේක කියවීම් හෝ විමර්ශනය සඳහා යොමු කිරීම | පැවරුම් | ඇගයීම් හා තක්සේරුකරණය ආකෘති / ප්‍රශ්න පත්‍ර |
|---|---|---|---|---|---|---|
| **1.0** | 1.1 ශුද්ධ සහ කෝමළ ස්වර ඇතුළත් රාග හඳුනාගනිමින් රාගධාරී සංගීතයේ ප්‍රායෝගික අධ්‍යයනයට එළඹේ. | * බිලාවල් රාගාශ්‍රිත ස්වර ස්ථාපන ගීත. | * ප්‍රායෝගික ක්‍රියාකාරකම්. | * W.B.මකුලොලුව, වින්සන්ට් සෝමපාල, ආනන්ද ජයසිංහ වැනි සංගීතඥයින් විසින් නිර්මිත ස්වර ස්ථාපන ගීත ගායනය. | * බිලාවල් රාගයේ යෙදෙන ශුද්ධ ස්වර 7 ආරෝහණ අවරෝහණ වශයෙන් ගයන්න.<br>* ස්වර ස්ථාපන ගීතය ගයන්න. | * ඒකලව ගීතය නිවැරදිව ගායනයෙන් පසුව ලකුණු ලබාදීම. |
| **1.0** | 1.2 මිශ්‍ර මත් කැටි ඇති තාල පද අධ්‍යයනය කරයි. | * තාලයක කොටස් | * ලිඛිත පරීක්ෂණයක් | * පාරිභාෂිත පද හා බැඳි කොටස් යෙදෙන අයුරු සෙවීමට යොමු කිරීම. | * තාලයක ඇති කොටස් වෙන වෙනම අතින් තාල් තබා පෙන්වන්න.<br>උදා:- ත්‍රිතාලය තාල් තබන්න. | * නිවැරදිව තාල් කොටස් අතින් තාල තබා පෙන්වීමෙන් පසු අගය කිරීම, ලකුණු ලබාදීම. |

| අනු අංකය | ඒකකය | අනු ඒකකය | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | අතිරේක කියවීම් හෝ විමර්ශනය සඳහා යොමු කිරීම | පැවරුම් | ඇගයීම් හා තක්සේරුකරණය ආකෘති / ප්‍රශ්න පත්‍ර |
|---|---|---|---|---|---|---|
| **1.0** | | * හින්දුස්ථානි තාල් පද (ඣප්තාලය, දීප්චන්දි තාලය) | * ප්‍රායෝගික ක්‍රියාකාරකම් | * තබ්ලාවෙන් මෙම තාල් වාදනය කරන අයුරු විමසීම. | * ඇමුණුම 2 යටතේ ඉදිරිපත් කර ඇති ගීත ලැස්තුවෙන් ඒ ඒ තාල් වලට අදාළ ගීත අත්ලෙන් තාල තබා ගයන්න. | * තාල් දෙකටම අදාළව ගීත දෙකක් ගායනා කරන ලද සිසුන් අගය කිරීම. |
| **2.0** | 2.1 වාදනයේ මූලික හැකියා වර්ධනය කර ගනියි. | * ස්වර වාද්‍ය භාණ්ඩ සඳහා හස්ත සාධන අභ්‍යාස<br>* ශුද්ධ ස්වර සහිත ගීත වාදනය. | * ප්‍රායෝගික ක්‍රියාකාරකම් | * ස්වර වාද්‍ය භාණ්ඩයකින් ස්වර නිපදවීම පිළිබඳ හුරුව ලබා ගැනීම.<br>* DVD, VCD ආදී උපකරණ වලින් වැඩිදුර ඉගෙනීම. | * ප්‍රායෝගික ක්‍රියාකාරකම්<br>* සර්පිනාවෙන් වාදනයක්. | * ස්වර පුවරු වාදනයකින් පසුව ලකුණු ලබාදීම. (ප්‍රායෝගික පරීක්ෂණයකින් පසුව)<br>* ශුද්ධ ස්වර ගීත ගායනයෙන් පසුව ඇගයීම. |
| **2.0** | 2.1 වාදනයේ මූලික හැකියා වර්ධනය කර ගනියි. | * සිතාරයේ සහ එස්රාජයේ ස්වර පිහිටීම සහ ස්වභාවය.<br>* ශුද්ධ ස්වර සහිත ගීත වාදනය. | * ප්‍රායෝගික ක්‍රියාකාරකම් | * භාණ්ඩ දෙකෙහිම වාදන ඇතුළත්ව ඇති DVD Pen Drive වල ඇතුළත් වාදන මගින් වැඩිපුර දැනුම ලබාගැනීම. | * ප්‍රායෝගික ක්‍රියාකාරකම් සිතාරය සහ එස්රාජයේ ස්වර පිහිටන අයුරු වාදනය කිරීම. | * ස්වර 7 නිවැරදිව වාදනය කිරීමෙන් පසු ලකුණු ලබාදීම. |

| අනු අංකය | ඒකකය | අනු ඒකකය | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | අතිරේක කියවීම් හෝ විමර්ශනය සඳහා යොමු කිරීම | පැවරුම් | ඇගයීම් හා තක්සේරුකරණය ආකෘති / ප්‍රශ්න පත්‍ර |
|---|---|---|---|---|---|---|
| **1.0** | කෙත හා බැඳි ගැමි ගී පිළිබඳ විමසමින් ගායනය කරයි. | * ගොයම් ගී ගායනය | * ප්‍රායෝගික ක්‍රියාකාරකම් | * 2010, 9 ශ්‍රේණියේ ගුරු මාර්ගෝපදේශය සිංහල ජන කවි සංග්‍රහය බැලීම. | * ගොයම් ගීතයක් ගයන්න. | * ගොයම් ගීතයේ නිවැරදි ස්වර අනුව ගායනා කිරීමෙන් පසු ලකුණු ලබාදීම. |
| **1.1** | * ශ්‍රී ලංකාවේ පැවති ප්‍රබල රංග සම්ප්‍රදායන් හඳුනා ගනිමින් අගය කරයි. | * නූර්ති ගී ගායනය. | * ප්‍රායෝගික ක්‍රියාකාරකම් | * වෙනත් නූර්ති ගීත සෙවීම. | * වෙස්සන්තර නූර්තියේ ගීයක් ගයන්න. | * ගීතය ගායනයෙන් පසුව ලකුණු ලබාදීම. |
| **1.1** | * ශ්‍රී ලංකාවේ පැවති ප්‍රබල රංග සම්ප්‍රදායන් හඳුනා ගනිමින් අගය කරයි. | * නව නාට්‍ය ගී ගායනය. | * ප්‍රායෝගික ක්‍රියාකාරකම් | * වෙනත් නව නාට්‍යය පී. වැලිකලගේ කුණ්ඩල කේශි වැනි ගීත | * නව නාට්‍ය ගීයක් ගයන්න. | * නිවැරදි ස්වර වලට ගායනා කිරීමෙන් පසුව ලකුණු ලබාදීම. |

## දෙවන වාරය - පෙරදිග සංගීතය

| අනු අංකය | ඒකකය | අනු ඒකකය | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | අතිරේක කියවීම් හෝ විමර්ශනය සඳහා යොමු කිරීම | පැවරුම් | ඇගයීම් හා තක්සේරුකරණය ආකෘති / ප්‍රශ්න පත්‍ර |
|---|---|---|---|---|---|---|
| **1.0** | 1.1 ශුද්ධ සහ කෝමළ ස්වර ඇතුළත් රාග හඳුනාගනිමින් රාගධාරී සංගීතයේ ප්‍රායෝගික අධ්‍යයනයට එළඹේ. | * භූපාලි රාගාශ්‍රිත ස්වර ස්ථාපන ගීත. | * ප්‍රායෝගික ක්‍රියාකාරකම් | * නිදහස් කාලවලදී භූපාලි රාගාශ්‍රිත සරල ගී ගායනය වාදනය කිරීම. | * භූපාලි රාගයේ ආරෝහණ, අවරෝහණ සහ ස්වර ස්ථාපන ගීතය ගයන්න. | * තනිතනිවම ගීතය ගායනා කිරීමෙන් අනතුරුව ලකුණු ලබාදීම. |
| **1.0** | 1.2 මිශ්‍ර මත් කැටි තාලපද අධ්‍යයනය කරයි. | * ඣප්තාල්, දීප්චන්දි තාල හා බැඳි නිර්මාණාත්මක ක්‍රියා | * ප්‍රායෝගික ක්‍රියාකාරකම් | * ඣප්තාලයට හා දීප්චන්දි තාලයට නිර්මාණය වී ඇති වෙනත් ගීත සොයා ගායනය වාදනය කිරීම. | * "සිරි සාර අති ශාන්ත" "රන්වන් කරල් සැලෙයි" යන තෝරාගත් ගී පද දෙක ගයමින් ඊට අදාළ තාල රටාව වාදනයට යොමු කිරීම. | * තනි තනිවම තාල තබමින් ගායනා කිරීමට සලස්වමින් ලකුණු ලබාදීම. |
| **2.0** | 2.1 වාදනයේ මූලික හැකියා වර්ධන කර ගනියි. | * ස්වර පුවරුව මඟින් කෝමල <u>ග</u> <u>නි</u> සහිත ස්වර ස්ථාපන ගීත. | * ප්‍රායෝගික ක්‍රියාකාරකම් | * විවිධ සංගීත ගත් කරුවන්ගේ ස්වර ප්‍රස්ථාර පොත් | * ස්වර පුවරුවක් මඟින් කෝමල <u>ග</u> <u>නි</u> යෙදෙන ස්වර ස්ථාපන ගීයක් වාදනය කරන්න. | * <u>ග</u> <u>නි</u> සහිත ස්වර නිවැරදිව වාදනයෙන් පසු එම සිසුවා අගය කිරීම හා ලකුණු ලබාදීම. |

| අනු අංකය | ඒකකය | අනු ඒකකය | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | අතිරේක කියවීම් හෝ විමර්ශනය සඳහා යොමු කිරීම | පැවරුම් | ඇගයීම් හා තක්සේරුකරණය ආකෘති / ප්‍රශ්න පත්‍ර |
|---|---|---|---|---|---|---|
| **2.1** | 2.1 වාදනයේ මූලික හැකියා වර්ධනය කර ගනියි. | * ස්වර වාද්‍ය භාණ්ඩ මඟින් ග නි සහිත ගීත වාදනය. | * ප්‍රායෝගික ක්‍රියාකාරකම් | * විවිධ සංගීත ගත් කරුවන්ගේ ගීත ස්වර ප්‍රස්ථාර පොත් | * ශුද්ධ ග , නි සහිත ගීතයක් වාදනය කිරීම.<br>* කෝමල ග නි සහිත ගීතයක් වාදනය කරවීම. | * නිවැරදිව ශුද්ධ හා කෝමල ග නි යොදා වාදනය කරන සිසුන්ව අගය කිරීම හා ලකුණු දීම. |
| **3.0** | 3.1 සරල ගීත රසාස්වාදයේ යෙදෙයි. | * සරල ගීතයක බස හා ආකෘතිය පිළිබඳ අදහස් දක්වයි. | * ප්‍රායෝගික ක්‍රියාකාරකම් | * ගීතයක ප්‍රධාන කොටස් දැක්වෙන වෙනත් ගීත පිළිබඳ විමර්ශනයක් කිරීම. | * සිසුන් වඩාත් ප්‍රියකරන සරල ගීතය ලෙස විමසා එහි එක් එක් කොටස් ගැන පැහැදිලි කිරීමක් කර එක් එක් කොටස ගායනය කරවීම. | * ගායනා කරන කොටස් අනුව ලකුණු ලබාදීම. |
| **3.0** | 3.1 භාරතීය ගීත ශෛලීන් රසාස්වාදයට හුරු වෙයි. | * භජන් ගී ගායනය | * ප්‍රායෝගික ක්‍රියාකාරකම් | * අන්තර් ජාලය ඇසුරෙන් භජන් ගී ශ්‍රවණයට යොමු වීම. | * කණ්ඩායම් වශයෙන් ගයන්න.<br>* තනි තනිවම ගයන්න. | * කණ්ඩායමට ලකුණු ලබාදීම.<br>* තනිතනිවම ලකුණු ලබාදීම.<br>* අගය කිරීම. |
| **1.0** | 1.1 කෙත හා බැඳි ගැමි ගී පිළිබඳ විමසමින් ගායනය කරයි. | * නෙළුම් ගී ගායනය. | * ප්‍රායෝගික ක්‍රියාකාරකම් | * සිංහල ජන කවි සංග්‍රහය.<br>* 2009 – 9 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය | * නෙළුම් ගීතය තනි තනිවම ගයන්න. | * ඒකලව ගයන්න. නිවැරදි නාද මාලාවට ගයන අයට ලකුණු ලබාදීම, ඇගයීම. |

| අනු අංකය | ඒකකය | අනු ඒකකය | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | අතිරේක කියවීම් හෝ විමර්ශනය සඳහා යොමු කිරීම | පැවරුම් | ඇගයීම් හා තක්සේරුකරණය ආකෘති / ප්‍රශ්න පත්‍ර |
|---|---|---|---|---|---|---|
| | | * කමත් ගී ගායනය. | * ප්‍රායෝගික ක්‍රියාකාරකම් | * 2009 – 9 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය | * කමත් ගීතය ගයන්න. | * තනිතනිව නිවැරදි ලයට ගයන සිසුනට ලකුණු ලබාදීම. |
| | | * ගැමි ගීයේ විශේෂ ලක්‍ෂණ | * ලිඛිත පරීක්‍ෂණයක් | * ශ්‍රී ලංකාවේ ජන සංගීතය – මොඩියුලය | * ගැමි ගීය විශේෂ ලක්‍ෂණ 5 ක් දක්වන්න. | * අදාළ කරුණු 5 ම නිවැරදි නම් ලකුණු ලබාදීම. |
| **5.0** | 5.1 දමිල බසින් රචිත ගීතයක් ගායනය කරයි. | * දමිල ගී ගායනය | * ප්‍රායෝගික ක්‍රියාකාරකම් | * අන්තර් ජාලය ඇසුරින් දමිල ගී ශ්‍රවණය කිරීම. | * දමිල ගීතයක් ගයන්න. | * ඒකලව ගායනයෙන් පසු ලකුණු ලබාදීම. |
| **5.0** | 5.2.1 පිය ගුණ ගීයක් ගායනය කරයි. | * පිය ගුණ වරුණ ගීයක් ගායනය | * ප්‍රායෝගික ක්‍රියාකාරකම් | * ගීත හා ප්‍රස්තාර (පියගුණ ගීත) ඇතුළත් පොත්.<br>* පෙළ පොත. | * පිය ගුණ වරුණ ගීතයක් ගයන්න. | * නිවැරදිව ස්වර ස්ථාන වලට ගයන ලද සිසුන්ට අගය කිරීම ලකුණු ලබාදීම. |
| **6.0** | 6.1 ශ්‍රී ලංකාවේ පැවති ප්‍රබල රංග සම්ප්‍රදායයන් හඳුනා ගනිමින් අගය කරයි. | | * ප්‍රායෝගික ක්‍රියාකාරකම් | * වෙනත් නූර්ති නාට්‍ය ගීත ගායනය. | * ඉගෙන ගත් නූර්ති ගීතය ගයන්න. | * තනි තනිවම නියමිත නාද මාලාවට ගායනයෙන් පසු ලකුණු ලබාදීම. |
| | | * නාඩගම් ගීත ගායනය. | * ප්‍රායෝගික ක්‍රියාකාරකම් | * වෙනත් නාඩගම් ගීත ගායනය<br>* නාඩගම් ගී සරණිය<br>* නාඩගම් ගී පොත් | * තෝරාගත් ගීතය ගයන්න. | * තනි තනිවම නියමිත නාදමාලාවට ගායනයෙන් පසු ලකුණු ලබාදීම. |

| අනු අංකය | ඒකකය | අනු ඒකකය | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | අතිරේක කියවීම් හෝ විමර්ශනය සඳහා යොමු කිරීම | පැවරුම් | ඇගයීම් හා තක්සේරුකරණය ආකෘති / ප්‍රශ්න පත්‍ර |
|---|---|---|---|---|---|---|
| | | * නාඩගම් සහ නූර්ති රංග සම්ප්‍රදායන්හි ශෛලිය, සංගීත හා විශේෂතා හඳුනා ගැනීම. | * කෙටි ලිඛිත පරීක්ෂණයක් | * මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍ර මහතාගේ “සිංහල ගැමි නාටකය”<br>* පුන්‍යසේන මහතාගේ “නාඩගම් ගී සරණිය” පොත් | * නාඩගම් හා නූර්ති සම්ප්‍රදායන් දෙකෙහි ආරම්භය, නිර්මාතෘවරු, ගීතනු යොදාගත් සංගීත භාණ්ඩ, විශේෂ ලක්‍ෂණ | * අදාළ විස්තර නාට්‍ය වර්ග දෙකෙහිම නිවැරදි පිළිතුරු පත් සඳහා ලකුණු ලබාදීම. |
| **8.0** | 8.1 ශ්‍රවණ මාධයෙන් ගී පද ප්‍රස්තාර කරයි. | * සදෘස්මත් හා ගීමත් හඳුනා ගැනීම. | * කෙටි ලිඛිත පරීක්ෂණය. | * ශ්‍රවණ මාධ්‍යයෙන් පැදි / සරල ගීත ප්‍රස්තාර කිරීම.<br>* “හෙළ ගී මඟ”<br>* “ශ්‍රී ලංකාවේ ජන සංගීතය” වැනි පොත් | * “කොබෝ කුරුලුවනේ” මෙම ගීත පාදයේ සදෘස්මත් හා ගීමත් සොයන්න. | * තනි තනිවම ප්‍රශ්නයට පිළිතුරු ලියන්න. නිවැරදි පිළිතුරු වලට ලකුණු ලබාදීම. |
| | | * යතිය සහ යති සහිත ගී පද ප්‍රස්තාරකරණය පිළිබඳ දැනුම ලබා ගැනීම. | * ප්‍රායෝගික පරීක්ෂණයක්<br>* කෙටි ලිඛිත පරීක්ෂණය. | * “හෙළ ගී මඟ; “ශ්‍රී ලංකාවේ ජන සංගීතය” වැනි පොත්<br>* යති සහිත පැදි ප්‍රස්තාර කිරීමට යොමු කිරීම. | * “බුද්ධං/ංසර/ණේSS/SSS/ සිරස/දරාS/ගෙනS/SSS යන ගී පද ගායනයෙන් යතියට හිමි මාත්‍රා ගණන සෙවීම.<br>* ප්‍රස්ථාර කිරීමෙන් යතියට හිමි මාත්‍රා ගණනය කිරීම. | * තනි තනිවම පද ප්‍රස්ථාර කරන්න.<br>* ගායනය කර පෙන්වන්න. සමස්ථය සඳහා ලකුණු පිරිනැමේ. |

| අනු අංකය | ඒකකය | අනු ඒකකය | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | අතිරේක කියවීම් හෝ විමර්ශනය සඳහා යොමු කිරීම | පැවරුම් | ඇගයීම් හා තක්සේරුකරණය ආකෘති / ප්‍රශ්න පත්‍ර |
|---|---|---|---|---|---|---|
| **8.0** | 8.1 බටහිර සංගීත ප්‍රස්ථාරකරණයේ මූලිකාංග විමසයි. | * රේඛා මණ්ඩලය මත ස්වර පිහිටන අයුරු අධ්‍යයනය කරමු. | * ලිඛිත පරීක්ෂණය. | * 2010 වර්ෂයේ 8 ශ්‍රේණියේ ගුරුමාර්ගෝපදේශය පිටු අංක 160-164 | * රේඛා මණ්ඩලය මත ශුද්ධ ස්වර හත ලකුණු කරන්න. | * තනි තනිවම ශුද්ධ ස්වර හත නියමිත ස්ථානයන්හි ලකුණු කිරීමෙන් පසු සුදුසු ලකුණු පිරිනැමීම, අගය කිරීම. |
| | | * බටහිර ප්‍රස්ථාරයකදී ස්වර සඳහා යොදා ගනු ලබන විවිධ සංකේත හා වටිනාකම් | * ලිඛිත පරීක්ෂණය. | * 2010 වර්ෂයේ 8 ශ්‍රේණියේ ගුරු මාර්ගෝපදේශය පිටු අංක 165-168 දක්වා<br>* වෙනත් සරල ස්වර ස්ථාපන ගීත බටහිර සංකේත භාවිතයෙන් ප්‍රස්තාර කරවීමට යොමු කිරීම. | * බටහිර ප්‍රස්තාර ක්‍රමයට එක් එක් මාත්‍රා සංඛ්‍යාවන් දැක්වීමට භාවිතා කරන සංකේත නම් කරන්න.<br>* නම් කරන ලද සකේත අදාළ කරගෙන “කඳු පෙළ අතරේ” ගීතය බටහිර ක්‍රමයට ප්‍රස්ථාර කරන්න. | * නිවැරදිව සංකේත යොදමින් ප්‍රස්ථාර කරන ලද සිසුන්ට ඇගයීමක් කිරීම.<br>* ලකුණක් ලබාදීම. |

## තුන්වන වාරය - පෙරදිග සංගීතය

| අනු අංකය | ඒකකය | අනු ඒකකය | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | අතිරේක කියවීම් හෝ විමර්ශනය සඳහා යොමු කිරීම | පැවරුම් | ඇගයීම් හා තක්සේරුකරණය ආකෘති / ප්‍රශ්න පත්‍ර |
|---|---|---|---|---|---|---|
| **1.0** | 1.1 ශුද්ධ සහ කෝමළ ස්වර ඇතුළත් රාග හඳුනාගනිමින් රාගධාරී සංගීතයේ ප්‍රායෝගික අධ්‍යයනයට එළඹේ. | * කාෆි රාගාශ්‍රිත ස්වර ස්ථාපන ගීත හඳුනා ගනිමු. | * ප්‍රායෝගික පරීක්ෂණය | * නිදහස් කාලවලදී බිලාවල් රාගයේ ස්වර සහ කාෆි රාගයේ ස්වර පිහිටන ස්ථාන සර්පිනාවක් මගින් සෙවීමට පෙළඹවීම. | * දී ඇති කාෆි ස්වර ස්ථාපන ගීතයේ ස්ථායි කොටස ගයන්න.<br>* දෙවනුව අන්තරා කොටස ගයන්න. | * ග නි ස්වර ස්ථාන නිවැරදිව, ස්වර ස්ථාපන ගීතයේ ස්ථායි කොටසින් ගැයීමෙන් පසු ඇගයීමක් කිරීම. ලකුණක් ලබාදීම. |
| | 1.2 මිශ්‍ර මත් කැටි තාලපද අධ්‍යයනය කරයි. | * දෙතිතට අයත් තිත් තාල පද හඳුනා ගනිමු. | * ලිඛිත පරීක්ෂණයක් | * දෙතිතට අයත් තිත්රූප වලට අයත් ජන ගී එක්රැස් කර විමර්ශනය කිරීම. | * දෙතිතට අයත් සුළු මැදුම් දෙතිත උඩරට, පහතරට, සබරගමු වශයෙන් බෙරපද යොදා ප්‍රස්ථාර කරන්න.<br>* එයටම ගැළපෙන ජන ගී පාදයක්ද ලියා ප්‍රස්ථාර කරන්න. | * නිවැරදි ප්‍රස්ථාරකරණයට ලකුණු ලබාදීම. |
| **1.0** | 1.2 මිශ්‍ර මත් කැටි ඇති තාලපද අධ්‍යයනය කරයි. | * බටහිර සංගීතයේ භාවිතාවන Six Eight ($6_8$) රිද්මයේ ස්වභාවය පැහැදිලි කරයි. | * ප්‍රායෝගික ක්‍රියාකාරකම් | * $6_8$, රිද්මයට ගයන වෙනත් පැරණි ගීත සෙවීමට මග පෙන්වීම, යොමු කිරීම. | * $6_8$, රිද්මයට ගායනා කළහැකි ඔබ කැමති ගීතයක් ගයන්න. | * නියමිත රිද්මයට ගයන සිසුන් කණ්ඩායම් අගය කිරීම.<br>* තනි තනිව ගායනය කළ පසු ලකුණු ලබා දීම. |

| අනු අංකය | ඒකකය | අනු ඒකකය | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | අතිරේක කියවීම් හෝ විමර්ශනය සඳහා යොමු කිරීම | පැවරුම් | ඇගයීම් හා තක්සේරුකරණය ආකෘති / ප්‍රශ්න පත්‍ර |
|---|---|---|---|---|---|---|
| **2.0** | 2.1 වාදනයේ මූලික හැකියා වර්ධන කර ගනියි. | * වාද්‍ය භාණ්ඩ මගින් විවිධ ස්වර ඇතුළත් ගීත වාදනය | * ප්‍රායෝගික ක්‍රියාකාරකම් | * ගීත ප්‍රස්ථාර පොත් | * විවිධ ස්වර සහිත සංගීත ඛණ්ඩයක් සර්පිනාවෙන් වාදනය කරන්න. | * නිවැරදි ස්වර ස්ථාපනයක් වාදනය කරන සිසුන්ව අගය කිරීම. |
| | | * ස්වර පුවරුව මගින් ළමා ගීත වාදනය. | * ප්‍රායෝගික ක්‍රියාකාරකම් | * ළමා ගීත ඇතුළත් ස්වර ප්‍රස්ථාර<br>* CD හෝ DVD තැටි | * ඔබ කැමති ළමා ගීතයක් වාදනය කරන්න. | * ගීත මිහිරිව හා නිවැරදිව වාදනය කළ සිසුන් වෙන් වෙන්ව ඇගයීම, ලකුණු ලබාදීම. |
| **2.0** | 2.1 භාරතීය ගීත ශෛලිය රසාස්වාදයට හුරුවෙයි. | * රවීන්ද්‍ර ගීත ගායනය | * ප්‍රායෝගික ක්‍රියාකාරකම් | * අන්තර්ජාලය ඇසුරෙන් රවීන්ද්‍ර ගීත ශ්‍රවණයට යොමු කිරීම. | * ඔබ ඉගෙනගත් වංග ගීතය (බෙංගාලි ගීතය) ගයන්න. | * සාමූහිකව හා ඒකලව ගීතය මිහිරිව ගයන ලද සිසුන් අගය කිරීම. |
| | | * රවීන්ද්‍ර ගීත හා භජන් ගී ශෛලීන් හි විශේෂතා | * ලිඛිත පරීක්ෂණයක් | * රවීන්ද්‍ර ගීත හා භජන් ගීත හා ලියවුණු වෙනත් ග්‍රන්ථ | * ඇමුණුම 01 හි දෙන ලද ප්‍රශ්නවලට හිස්තැන් පුරවන්න. | * නිවැරදිම පිළිතුරු සපයන ලද සිසුන්ට ලකුණු ලබාදීම. |
| **3.0** | 3.3 කිතුණු බැති ගී රසාස්වාදනයේ යෙදෙයි. | * කිතුණු බැති ගී ගායනය | * ප්‍රායෝගික ක්‍රියාකාරකම් | * අන්තර්ජාලය ඇසුරෙන් කිතුණු බැති ගී ශ්‍රවණය කරන්න. | * ඔබ ඉගෙන ගත් කිතුණු බැති ගීය ගයන්න. | * නිවැරදි නාද මාලාවට මිහිරිව ගයන සිසුන්ව අගය කිරීම. ලකුණු ලබාදීම. |

| අනු අංකය | ඒකකය | අනු ඒකකය | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | අතිරේක කියවීම් හෝ විමර්ශනය සඳහා යොමු කිරීම | පැවරුම් | ඇගයීම් හා තක්සේරුකරණය ආකෘති / ප්‍රශ්න පත්‍ර |
|---|---|---|---|---|---|---|
| **5.0** | 5.2.2 මව්ගුණ ගීයක් ගායනය කරයි. | * මව් ගුණ ගීයක් ගායනය. | * ප්‍රායෝගික ක්‍රියාකාරකම් | * මව්ගුණ ගැන ගීත ලියා ඇති පොත් කියවීම. | * ඔබ ඉතාම ප්‍රියකරන මව්ගුණ ගීයක් ගයන්න. | * මව් සෙනෙහස උද්දීපනය වන අයුරින් ගීතය මිහිරිව ගයන සිසුන්ව ඉතා අගය කිරීම. |
| **6.0** | 6.1 ශ්‍රී ලංකාවේ පැවති ප්‍රබල රංග සම්ප්‍රදායන් හඳුනා ගනිමින් අගය කරයි. | * නූර්ති ගීත ගායනය | * ප්‍රායෝගික ක්‍රියාකාරකම් | * නූර්ති ගීත පටිගත කළ CD තැටි සෙවීම.<br>* නූර්ති ගීත ශතකය ග්‍රන්ථය කියවීම. | * ඉගෙන ගත් නූර්ති ගීතය හැකිනම් රංගනය සමගම ගයන්න. | * විශේෂ හැකියාවන් තිබෙන සිසුන් රංගනය සමගම ගායනය කිරීම. විශේෂයෙන් අගය කිරීම. ඉතාම ඉහළින් අගය කිරීම. |
| **5.0** | 5.2.2 | * මද්දලය හා පද | * ඇගයීම් ලිඛිත පරීක්ෂණය | * මද්දලය භාවිතා කරන ගීත ශ්‍රවණය කරන්න.<br>* 2010 8 ශ්‍රේණියේ ගුරු මාර්ගෝපදේශයේ පිටු අංක 131 බලන්න. | * ඇගයීම් පත්‍රිකාවේ ඇතුළත් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම. | * ඇගයීම් පත්‍රිකාවේ ප්‍රශ්නවලට පිළිතුරු නිවැරදිව සැපයූ සිසුන්ව පන්තිය ඉදිරියට ගෙන අගය කිරීම. ලකුණු ලබාදීම. |

| අනු අංකය | ඒකකය | අනු ඒකකය | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | අතිරේක කියවීම් හෝ විමර්ශනය සඳහා යොමු කිරීම | පැවරුම් | ඇගයීම් හා තක්සේරුකරණය ආකෘති / ප්‍රශ්න පත්‍ර |
|---|---|---|---|---|---|---|
| **5.0** | | * නව නාට්‍ය ගී ගායනය | * ප්‍රායෝගික ක්‍රියාකාරකම් | * වෙනත් නවනාට්‍ය ගීත ඇතුළත් පොත්<br>* පටිගත කරන ලද ගීත ශ්‍රවණය කිරීම. | * රතු හැට්ටකාරි නාට්‍යයේ "දී කිරි දී කිරි" ගීතය ගයන්න. | * සාමූහිකව හා ඒකලව මිහිරිව ගයන සිසුන්ව ඉතා අගය කිරීම.<br>* රංගනයත් සමඟ ගයන සිසුන්ව පන්තියට හඳුන්වා දෙමින් අගය කිරීම. |
| **7.0** | 1.1 ගී තනු නිර්මාණයේ අත්හදා බැලීම් කරයි. | * රිද්ම රටාවකට ස්වර යෙදීම. | * ලිඛිත පරීක්ෂණයක් | * විවිධ සරල රිද්ම රටා නිර්මාණයට පෙළඹවීම. | * මාත්‍රා 2 මාත්‍රා 3 මාත්‍රා 4 ආදී වශයෙන් රිද්ම රටාවන් කිහිපයක් ගොඩනගන්න.<br>* ඉන් එක් රිද්ම රටාවක් සඳහා කෙටි තනුවක් නිර්මාණය කරන්න. | * දක්ෂ ලෙස නිර්මාණය කළ සිසුන්ව ඒකලව අගය කිරීම. ලකුණු ලබාදීම. |
| **7.0** | 1.1 | * පද කොටස් වලට තනු යෙදීම. | * ලිඛිත පරීක්ෂණයක් | * විවිධ ගී තනු නිර්මාණයට නිදහස් කාලවලදී පෙළඹෙන්න. | * ඇමුණුම 01 හි සඳහන් පද පේළිවලට සුදුසු සරල තනුවක් නිර්මාණය කරන්න. | * පද ප්‍රස්ථාරය සමග නිර්මාණාත්මකව යෙදූ මිහිරි තනු වයමින් සිසුන්ව අගය කිරීම.<br>* පන්තිය ඉදිරියට ගෙන්වා ඉතාම ඉහළින් අගය කිරීමක් කිරීම. |